# වාර්ෂික කාර්යසාධන වාර්තාව
# வருடாந்த முன்னேற்ற அறிக்கை
# Annual Performance Report

# 2013

සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය
கலாசார மற்றும் கலை அலுவல்கள் அமைச்சு
Ministry of Culture & the Arts

# සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 402 ට අනුව සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේ
ලේකම්වරයා විසින් ඉදිරිපත් කරනු ලබන

# වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2013

**ප්‍රකාශනය**

**සැලසුම් අංශය**

**සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය**

**8 වන මහල**

**සෙත්සිරිපාය, බත්තරමුල්ල**

## ගරු අමාත්‍යතුමාගේ පණිවිඩය



## කලා කටයුතු කාර්යසාධනය ජාතික වගකීමකි

ජාතික කාර්ය සාධනයට උරදෙන සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය වර්ෂයක් පුරා අදාළ ක්ෂේත්‍රගත සංවර්ධන කාර්යයෙහි නිරත වෙමින් ලබා ගත් ප්‍රගතිය වාර්තා ගත කරන අවස්ථාවට ජයග්‍රාහී සටහනක් තබන්නට ලැබීම මහත් සතුටකි. දේශීය සංස්කෘතිය, පාරම්පරික උරුමය හෝ කලාව භෞතිකමය අගයකට වඩා මානුෂීය ගුණයෙන් අනූන වේ. ඒ නිසාම එහි වටිනාකම තක්සේරු වන්නේ එමඟින් අප ලබන ජීවිතාවබෝධය හා වින්දනය පදනම් කර ගෙනය. එය හුදෙක්ම පෞද්ගලිකත්වය මත රඳා පවතී. එහෙත් සංස්කෘතිය හා කලාව තුළ මුලුමහත් සමාජය ඇද බැඳගත් පසුබිමක් නිර්මාණය වේ. මේ සඳහා සියලු පුරවැසියන්ගේ අවධානය යොමුවීම ඉතා වැදගත් ය.

කාර්ය සාධනය සාමූහික ක්‍රියාවලියක ප්‍රතිඵලයකි. දේශපාලන හා පරිපාලනමය තීරණ මත ක්‍රියාවට නංවන වැඩසටහන්, ව්‍යාපෘති හා දෛනික ක්‍රියාවලියේ සමස්ත ප්‍රතිඵලය අත්පත් කර ගැනීම කාර්ය සාධනය යි. වාර්ෂික ඇගයුම් සහිත ව මැන බලා තක්සේරුමය තත්වයට පරිවර්තනය කරගත් අපේ ක්‍රියාදාමය ජනගත වන අවස්ථාවේ සුබවාදී ආකල්ප තවදුරටත් ජනිත වන පසුබිමක් වේවා!, යි ප්‍රාර්ථනා කරමි.

**ටී. බී. ඒකනායක**

සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍ය

පෙරවදන



## නිරන්තර උත්සාහය ජයග්‍රාහී පියවරකි

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියට අනුගතව 2013 වර්ෂය පුරා සිදු කල සංස්කෘතික හා කලා කටයුතු සම්බන්ධ කාර්යාවලිය ප්‍රගති සටහන් සහිතව වාර්තාගත කරන්නට ලැබීම භාග්‍යයකි. ශ්‍රී ලාංකේය සංස්කෘතික හර පද්ධතියත්, කලා කටයුතු හා ඊට සමීප මානව සම්පත් සංවර්ධනයත් උදෙසා අප ලබාදුන් ශක්ති සම්පන්න ප්‍රබල දායකත්වය පිළිබිඹු කරන වාර්ෂික කාර්ය සාධන වාර්තාව සාර්ථක ප්‍රතිඵල සටහනක් වශයෙන් හැඳින්විය හැකිය. ආයතනික ව්‍යුහය තුල ක්‍රියාත්මක කෙරෙන, ජාතික වශයෙන් සපලදායී ලෙස මානව හා භෞතික සම්පත් යොදාගත් ආකාරය නිසා ඉහළ අගයක් ගන්නා කාර්ය සාධනය රට - දැයේ ඉදිරි පියවර සනිටුහන් කරයි. දේශපාලන හා පරිපාලනමය වශයෙන් සාමූහිකව ක්‍රියාත්මක කෙරෙන අමාත්‍යාංශ කාර්යභාරය පොදු ජන යහපතට යොදා ගැනීමට අප ගත් නිරන්තර උත්සාහයේ ජයග්‍රාහී පියවරක සටහන් සළකුණු තබන 2013 කාර්ය සාධන වාර්තාව ඔබ අතට පමුණුවන්නේ හෘදයාංගම සුබ පැතුම් ද එක් කරමිනි.

පාලන හා මූල්‍ය, ඉදිකිරීම්, විදේශ, මාධ්‍ය, සැලසුම්, ප්‍රසම්පාදන, අභ්‍යන්තර විගණන හා පර්යේෂණ යන අංශවල සාමූහික වගකීමෙන් ක්‍රියාත්මක කළ වාර්ෂික ක්‍රියාදාමය බෙහෙවින් ම සාර්ථක බව ප්‍රසංශනීය ව සටහන් කළ හැකිය. පොදු සංවර්ධන කටයුතුවල දී එක අරමුණක් ඔස්සේ නිවැරදි දිශාවට දෝලනය වී සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය දියත් කළ වැඩපිළිවෙළ සාර්ථක විය. කලා ක්ෂේත්‍රයේ නියැලෙන අයටත්, ජනතාවටත් එකසේ ඉදිරියට යා හැකි ගමන් මගක් හෙළි පෙහෙළි වී තිබේ. එමගින් සාර්ථක ප්‍රතිඵල අත්පත් කරගැනීමට අප සියලු දෙනාම එකමුතු වී වැඩ කරමු. 2014 වර්ෂයේ කාර්යසාධනය වඩාත් සපලදායි කර ගැනීමට හැකියාව ලැබේවා යි ප්‍රාර්ථනා කරමි.

**වසන්ත ඒකනායක**
ලේකම්
සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය

# සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය
# වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2013

සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය සහ අදාළ අංශ මඟින් 2013 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා සිදු කරන ලද කාර්යභාරය මෙම වාර්ෂික කාර්යසාධන වාර්තාවේ අඩංගු වන අතර අදාළ අංශවල මූල්‍ය හා භෞතික ප්‍රගතිය, සේවක සංඛ්‍යාව, වාර්ෂික පුහුණු වැඩසටහන් ආදි විස්තර ඇතුළත් කොට ඇත. තවද මෙම අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවලින් ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය හැර අනිකුත් ආයතන වෙන වෙනම කාර්යසාධන වාර්තා ඉදිරිපත් කරන බැවින් මෙම වාර්ෂික කාර්යසාධන වාර්තාවට සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය හා ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය 2013 වසර පුරා සිදු කරනු ලැබූ කාර්යභාරය පමණක් ඇතුළත් කොට ඇති බැවි සැලකුව මැනවි.

# සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය
# වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2013

පටුන | පිටු අංක


**1. සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය** **08**
- 1.1 දැක්ම, මෙහෙවර, අරමුණු
- 1.2 සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය – සංවිධාන සැලැස්ම

**2. පාලන කටයුතු** **10**
- 2.1 ප්‍රධාන නිලධාරි මණ්ඩලය - 2013
- 2.2 2013.12.31 දිනට අමාත්‍යාංශ සේවක සංඛ්‍යාව
  - 2.2.1 ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරි මණ්ඩලය
  - 2.2.2 ද්විතීක මට්ටමේ නිලධාරි මණ්ඩලය
  - 2.2.3 තෘතීයික මට්ටමේ නිලධාරි මණ්ඩලය
  - 2.2.4 ප්‍රාථමික මට්ටමේ කාර්ය මණ්ඩලය
- 2.3 අමාත්‍යාංශයේ නිලධාරීන් දේශීය පුහුණු වැඩසටහන් සඳහා සහභාගි කරවීම
- 2.4 2013 වසර තුළ අමාත්‍යාංශයෙන් ස්ථාන මාරුවීම් හා විශ්‍රාම ලබාගිය නිලධාරි සංඛ්‍යාව
  - 2.4.1 ස්ථාන මාරුවීම්
  - 2.4.2 විශ්‍රාම ලබා ගැනීම්

**2.අ. සංස්කෘතික මධ්‍යස්ථාන පාලනය** **14**
- 2.a.I කාර්යභාරය

**3. මූල්‍යය කටයුතු** **15**
- 3.1 සංස්කෘතික අමාත්‍යාංශ වැඩ සටහන් පිළිබඳ වියදම්
  - 3.1.1 පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම්
  - 3.1.2 පුනරාවර්තන වියදම් විස්තර
  - 3.1.3 ප්‍රාග්ධන වියදම් විස්තර
- 3.2 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමට අදාළ විස්තර

**4. සංස්කෘතික ප්‍රවර්ධනය** **19**
- 4.1 සංස්කෘතික මධ්‍යස්ථාන වැඩසටහන
  - I. සංස්කෘතික මධ්‍යස්ථාන පාඨමාලා
  - II. ජාතික සහ ප්‍රාදේශීය සංස්කෘතික වැඩසටහන් සඳහා සංස්කෘතික මධ්‍යස්ථාන දායකත්වය
  - III. සංස්කෘතික මධ්‍යස්ථාන පුස්තකාල සේවාව
  - IV. දේශීය නර්තන ශිල්පී සංචිතය
- 4.2 සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය දායකත්වය දැක් වූ ජාතික වැඩසටහන් සහ පවත්වන ලද විශේෂ වැඩසටහන්
- 4.3 ලෝක ආදිවාසී දිනය සැමරීම 2013
- 4.4 "ජාතික සාහිත්‍ය කලා ප්‍රසාදිනී" 2013 ජාතික සාහිත්‍ය කලා මහෝත්සවය
- 4.5 අන්තර් රාජ්‍ය සේවක නිර්මාණ තරගාවලිය
- 4.6 රසවින්දන වැඩසටහන් පැවැත්වීම
- 4.7 අස්පර්ෂ උරුම ලේඛනය සකස් කිරීම
- 4.8 අස්පර්ශ උරුමය යළි නිරාවරණය කිරීමේ නියමු ව්‍යාපෘතිය- මාතලේ දිස්ත්‍රික්කය
- 4.9 ජන සංගීත සංරක්ෂණ ව්‍යාපෘතිය
- 4.10 ශාන්තිකර්ම පුහුණුව ලබාදීම
- 4.11 අංගම් සටන් ශිල්ප කලාව ව්‍යාප්ත කිරීම
- 4.12 සංස්කෘතික ප්‍රවර්ධන අංශය මඟින් පවත්වන ලද වාර්ෂික පුහුණු වැඩසටහන්
- 4.13 මූල්‍ය ප්‍රගතිය - සංස්කෘතික ප්‍රවර්ධන වැඩසටහන්
- 4.14 අමාත්‍යාංශ වෙබ් අඩවියට වෙබ් බිහිදොර එක් කිරීම
- 4.15 ආයතන කටයුතු

**5. සංස්කෘතික යටිතල පහසුකම් සංවර්ධනය** **32**

5.1 සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීම් හා නඩත්තු කටයුතු

I. 2013 වසර අවසන් වන විට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සංස්කෘතික මධ්‍යස්ථාන ව්‍යාප්තිය

II. නව සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීම - 2013

III. සංස්කෘතික මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීම 2013

5.2 දේශීය අරමුදල් වලින් ක්‍රියාත්මක කෙරෙන අනිකුත් ව්‍යාපෘති

I. ආදිවාසී ජන සංස්කෘතිය සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය

II. සංස්කෘතික මධ්‍යස්ථානය හා සුනාමි පර්යේෂණ ආයතනය ඉදිකිරීම - හික්කඩුව

III. සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානය - මාතර, නාවිමන, මොරකැටියහේන

IV. වේයන්ගොඩ පුහුණු මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම

V. සංගීත හා නර්තන භාණ්ඩ නිෂ්පාදනය කරන පැරණි ශිල්ප ගම්මාන සංවර්ධනය කිරීම

**6. පර්යේෂණ හා සංවර්ධන කටයුතු** **39**

6.1 ජාතික වීර ලේකම් කාර්යාලය පිහිටුවීම

6.2 සීගිරි උරුම කළමණාකරණය සඳහා වන පර්යේෂණාත්මක ව්‍යාපෘතිය

6.3 ඵලදායිතා ප්‍රතිසංස්කරණ වැඩසටහන

**7. විදේශ සංස්කෘතික සබඳතා** **44**

7.1 එළඹ ඇති ද්විපාර්ශ්වික ගිවිසුම්

7.2 පවත්වන ලද සංස්කෘතික සහයෝගිතා වැඩසටහන්

7.3 ශ්‍රී ලංකාවට විදේශීය කණ්ඩායම් පැමිණීම්

7.4 විශේෂ වැඩසටහන්- අවුකන බුදුපිළිමයේ අනුරුවක් ඉන්දියාවටත්

**8. සැපයුම් හා ප්‍රසම්පාදන කටයුතු** **48**

8.1 සංස්කෘතික මධ්‍යස්ථාන සඳහා භාණ්ඩ/සේවා ලබාදීම

8.2 අමාත්‍යාංශය සඳහා භාණ්ඩ/සේවා ලබාදීම

**9. අභ්‍යන්තර විගණන කටයුතු** **49**

9.1 සාමාන්‍ය විගණන පරීක්ෂාවන්

9.2 විශේෂ විගණන පරීක්ෂාවන්

**10. ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය** **51**

10.1 ප්‍රතිපාදන සහ මූල්‍ය ප්‍රගතිය - 2013

10.2 කාර්ය මණ්ඩලය - 2013

10.3 ප්‍රගතිය - 2013

10.3.1 2013 ජනවාරි 01 සිට 2013 දෙසැම්බර් 31 දක්වා බලපත්‍ර නිකුත් කිරීම සඳහා ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලයේ පරීක්ෂාවට ලක් වූ නිර්මාණ

10.3.2 2010 - 2013 දක්වා උපයා ඇති රාජ්‍ය ආදායම්

10.3.3 නිරන්තර සේවා

# 1. සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය

## 1.1 දැක්ම, මෙහෙවර, අරමුණු

### දැක්ම

අනාගතය උදෙසා ජාතියේ අභිමානය සහ අද්විතීය සංස්කෘතික උරුමය ආරක්ෂා කිරීමට කැප වූ සාඩම්බර ශ්‍රී ලංකාවක්.

### මෙහෙවර

ස්වකීය සමස්ත සංවර්ධන ක්‍රියාවලිය ප්‍රවර්ධනය කරනු ලබන රටක් වශයෙන් ලොව සෙසු රටවල් සමග ඉදිරියට ගමන් කිරීම පිණිස ශ්‍රී ලාංකීය සංස්කෘතිය සංරක්ෂණය, ප්‍රවර්ධනය හා ප්‍රචාරණය සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සහ වැඩසටහන් සකස් කර ක්‍රියාත්මක කිරීම.

### අරමුණු

රටක සංස්කෘතිය, එම රටේ ජනතාව සුඛිත මුදිත කිරීම සඳහා හඳුන්වාදෙනු ලබන සියළු වැඩසටහන් වඩාත් ඵලදායී ලෙස සඵල කර ගැනීම සඳහා ඉවහල් වන, ජනතා හැසිරීම මෙහෙය වන ප්‍රධාන මෙවලම ලෙස සලකා අරමුණු හඳුනාගෙන ඇත.

- රටේ පොදු ජාතික සංවර්ධන ප්‍රතිපත්තිය සාර්ථක කර ගැනීමට හේතුවන ආකාරයෙන් ජනතාව ස්වයං ව මෙහෙයවන සාධනීය සංස්කෘතික පරිසරයක් රට තුළ ගොඩනැගීම.
- ශ්‍රී ලාංකික බහු ජාතිකත්වය පිළිගනිමින්, ඒ එක් එක් උප සංස්කෘතිවල අනන්‍යතාව ආරක්ෂා කරන අතරම සියලු උප සංස්කෘති එක්ව ගෙන ශ්‍රී ලාංකික වූ මහා සංස්කෘතියක් සහිත රටක් ලෙස ඉදිරියට පවත්වාගෙන යාම සහ විවිධ බලවේග හරහා හානියට පත්වන සාධනීය සංස්කෘතිකාංග, එවැනි හානිවලින් වළක්වා ගැනීම.
- සංස්කෘතික උරුමයන් සංරක්ෂණය, පවත්වාගෙන යාම සහ ප්‍රයෝජනයට ගැනීම මගින් රටේ ජනතාවගේ ජීවිතයේ සංස්කෘතිකමය හැඩ ගැස්ම සකස් කර ගැනීමට මං සැලසීම.
- සාධනීය සංස්කෘතිකාංග හඳුනාගැනීමට හා ඒවා තම ජීවිතයට යාකර ගැනීමට ජනතාව පෙළඹවීම හා ඒ මගින් ශ්‍රී ලාංකික අනන්‍යතාව ඇති සංස්කෘතියක් ගොඩ නැගීම.
- සංස්කෘතික පරිහානියට හේතුවන බාහිර හා අභ්‍යන්තර සාධක හඳුනාගැනීමේ හා ඒවා නිශේධනය කිරීමේ ස්වයං ශක්තිය ජනතාවට ලබාදීම.
- දේශාභිමානී චින්තනය පෙරටුකරගත් සංවර්ධන ඉලක්ක සපුරාලීමට සමත්, ස්වයං අභිප්‍රේරණික වූත්, සාමූහිකවූත්, බලවේගයක් ලෙස සමාජය තුළ මුල් බැස ගැනීමට සැලැස්වීම.

# 1.2 සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය - සංවිධාන සැලැස්ම



# 2. පාලන කටයුතු

සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේ සියළුම පරිපාලනමය කටයුතු ක්‍රියාත්මක කරලීම හා එහි අධීක්ෂණ ක්‍රියාවලිය පාලන අංශය මගින් සිදු කෙරේ.

## 2.1 ප්‍රධාන නිලධාරි මණ්ඩලය- 2013

| | | තනතුර | නම |
|---|---|---|---|
| 1. | | අමාත්‍යාංශ ලේකම් | වසන්ත ඒකනායක මහතා |
| 2. | I | අතිරේක ලේකම්<br>(සංස්කෘතික ප්‍රවර්ධන) | එච්.ඩී.එස්.මල්කාන්ති මහත්මිය |
| | II | අතිරේක ලේකම්(පාලන හා මුදල්/විදේශ/ඉදිකිරීම්) | එන්.පී.වී.සී. පියතිලක මහතා - 2013 සැප්තැම්බර් 03 දක්වා<br>එස්.එම්.ජී.එන්. ධර්මසේන මහතා - 2013 දෙසැම්බර් 03 දින සිට |
| 3. | | ප්‍රධාන ගණකාධිකාරී | සී.වීරසිංහ මහතා - 2013 ජූලි 31 දක්වා<br>ආර්.එම්.එම්. රත්නායක මිය - 2013 ජූලි 30 දින සිට |
| 4. | | අධ්‍යක්ෂ(සැලසුම්) | කේ.ඩබ්ලිව්.එස්.පී.අතුකෝරල මහත්මිය |
| 5. | I | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්<br>(සංස්කෘතික ප්‍රවර්ධන/ ඉදිකිරීම්) | ඩබ්.සුනීතා කුරේ මහත්මිය |
| | II | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්<br>(පාලන/මධ්‍යස්ථාන පාලන/විදේශ) | ඒ.ඩී.ආර්.එස්. අතපත්තු මහත්මිය |
| 6. | I | ප්‍රධාන අභ්‍යන්තර විගණක | කේ.කේ.ජී.සිසිර කුමාර මහතා |
| | II | ගණකාධිකාරී ගෙවීම් | එස්.ඩබ්ලිව්. ගුණවර්ධන මහත්මිය |
| | III | ගණකාධිකාරී(ප්‍රසම්පාදන) | ඩී.ඩී.සී.සෙනෙවිරත්න මහත්මිය |
| 7. | I | සහකාර ලේකම් (සංස්කෘතික ප්‍රවර්ධන/ඉදිකිරීම්) | වජිර රත්නායක මහතා |
| | II | සහකාර ලේකම් (පාලන/මධ්‍යස්ථාන පාලන) | බී.ඒ.අයි.පියුමි මහත්මිය |
| | III | සහකාර ලේකම්(විදේශ/ප්‍රවාහන) | ඩී. ලියනගම මහත්මිය |
| 8. | | වැ. බ. පරිපාලන නිලධාරී | ආර්.ඒ.ඩබ්ලිව්. පෙරේරා මහතා |

## 2.2. 2013.12.31 දිනට අමාත්‍යාංශ සේවක සංඛ්‍යාව

### 2.2.1. ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරි මණ්ඩලය

| තනතුර | සේවය | ශ්‍රේණිය / පංතිය | වැටුප් කේතය | සේවා මට්ටම | අනුමත | | | දැනට සිටින | | | වෙනත් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | ස්ථිර | තාවකාලික | කොන්ත්‍රාත් | ස්ථිර | තාවකාලික | කොන්ත්‍රාත් | |
| ලේකම් | ශ්‍රී. ල. ප. සේ. | විශේෂ | SL.4 | 1 | 01 | - | - | 01 | - | - | |
| අතිරේක ලේකම් | ශ්‍රී. ල. ප. සේ. | විශේෂ | SL.3 | 1 | 02 | - | - | 02 | - | - | |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | ශ්‍රී. ල. ප. සේ. | I | SL.1 | 1 | 02 | - | - | 02 | - | - | |
| ප්‍රධාන ගණකාධිකාරි | ශ්‍රී. ල. ග. සේ. | I | SL.1 | 1 | 01 | - | - | 01 | - | - | |
| අධ්‍යක්ෂ | ශ්‍රී. ල. සැ. සේ. | විශේෂ | SL.1 | 1 | 01 | - | - | 01 | - | - | |
| සහකාර ලේකම් | ශ්‍රී. ල. ප. සේ. | III | SL.1 | 1 | 02 | - | - | 02 | - | - | |
| නියෝජ්‍යඅධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී. ල. ප. සේ. | II/III | SL.1 | 1 | 01 | - | - | 01 | - | - | |
| ගණකාධිකාරි | ශ්‍රී. ල. ග. සේ. | I | SL.1 | 1 | 02 | - | - | 02 | - | - | |
| ප්‍රධාන අභ්‍යන්තර විගණක | ශ්‍රී. ල. ග. සේ. | I | SL.1 | 1 | 01 | - | - | 01 | - | - | |
| ඉංජිනේරු | ශ්‍රී. ල. ඉ. සේ. | II/III | SL.1 | 1 | 01 | - | - | 01 | - | - | |
| **ජ්‍යෙෂ්ඨ මට්ටම** | | | | | **14** | | | **14** | | | |

### 2.2.2. ද්විතීක මට්ටමේ නිලධාරි මණ්ඩලය

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පරිපාලන නිලධාරි | රා. කා. ස. සේ | අධි ශ්‍රේණිය | MN.7 | 02 | 01 | - | - | වැ.බ. 01 | - | - | පුරප්පාඩු 01 |
| ලේකම්තුමාගේ පෞද්ගලික ලේකම් | තාවකාලික | - | - | 02 | 01 | - | - | 01 | - | - | |
| භාෂා පරිවර්තක | භාෂා පරිවර්තක සේවය | - | MN.6 | 02 | 02 | - | - | 01 | - | - | පුරප්පාඩු 01 |
| **ද්විතීයික මට්ටම** | | | | | **04** | | | **03** | | | |

## 2.2.3. තෘතීයික මට්ටමේ නිලධාරි මණ්ඩලය

| තනතුර | සේවය | ශ්‍රේණිය / පංතිය | වැටුප් කේතය | සේවා මට්ටම | අනුමත | | | දැනට සිටින | | | වෙනත් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | ස්ථිර | තාවකාලික | කොන්ත්‍රාත් | ස්ථිර | තාවකාලික | කොන්ත්‍රාත් | |
| අයවැය සහකාර | ආශ්‍රිත නිලධාරීන් | - | **MN.4** | **03** | **01** | - | - | **01** | - | - | |
| සංස්කෘතික ප්‍රවර්ධන නිලධාරි | එම | | **MN.4** | 03 | 201 | - | - | 184 | - | - | පුරප්පාඩු 17 |
| සංවර්ධන සහකාර | එම | - | **MN.4** | **03** | 04 | - | - | 04 | - | - | |
| සංවර්ධන නිලධාරි | එම | | **MN.4** | **03** | 125 | | | 120 | | | පුරප්පාඩු 05 |
| නීති සහකාර | එම | | **MN.4** | **03** | 01 | - | - | - | - | - | පුරප්පාඩු 01 |
| ප්‍රලේඛන සහකාර | එම | | **MN.4** | **03** | 01 | - | - | 01 | - | - | |
| විමර්ෂණ සහකාර | එම | | **MN.4** | **03** | 01 | - | - | 01 | - | - | |
| ගිණුම් සහකාර | එම | | **MN.4** | **03** | 01 | - | - | 01 | - | - | |
| තොරතුරු තාක්ෂණ සහකාර | එම | | **MN.4** | **03** | 01 | - | - | - | - | - | පුරප්පාඩු 01 |
| මාධ්‍ය සහකාර | එම | | **MN.4** | **03** | 02 | - | - | - | - | - | පුරප්පාඩු 02 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | රා. කා. ස. සේ. | **I/II/III** | **MN.2** | **03** | 55 | - | - | 45 | - | - | පුරප්පාඩු 10 |
| සහකාර සංස්කෘතික ප්‍රවර්ධන නිලධාරි | දෙපාර්තමේන්තුගත | | **MN.**1 | 03 | 184 | - | - | 156 | - | - | පුරප්පාඩු 28 |
| වීඩියෝ කැමරා ක්‍රියාකරවන්නා | තාවකාලික | | - | 03 | 01 | - | - | - | - | - | ම.සංස්.අ. අනුයුක්ත කර ඇත. |
| නිශ්චල ඡායාරූප ශිල්පි | එම | | - | 03 | 01 | - | - | - | - | - | ම.සංස්.අ. අනුයුක්ත කර ඇත |
| **තෘතීයික මට්ටම** | | | | | **579** | | | **513** | | | |

## 2.2.4. ප්‍රාථමික මට්ටමේ කාර්ය මණ්ඩලය

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| රියදුරු | ඒකාබද්ධ සේවය | | | 4 | 19 | - | - | 18 | 01 | - | |
| කා.කා.ස. | එම | | | 4 | 20 | - | - | 14 | 05 | - | 01 |
| පිළිගැනීමේ නිළධාරී | දෙපාර්තමේන්තුගත | | | 4 | 01 | - | - | 01 | - | - | - |
| සංස්කෘතික මධ්‍යස්ථාන කා.කා.ස. | දෙපාර්තමේන්තුගත | | | 4 | 184 | - | - | 174 | 05 | - | පුරප්පාඩු 05 |
| සංස්කෘතික මධ්‍යස්ථාන මුරකරු | දෙපාර්තමේන්තුගත | | | 4 | 184 | - | - | 171 | 08 | - | පුරප්පාඩු 05 |
| වීඩියෝකරණ සහකාර | තාවකාලික | | | 4 | 01 | - | - | - | - | - | පුරප්පාඩු 01 |
| **ප්‍රාථමික මට්ටම** | | | | | **409** | | | **378** | **19** | | **12** |

## 2.3 අමාත්‍යාංශයේ නිලධාරින් දේශීය පුහුණු වැඩසටහන් සඳහා සහභාගි කරවීම

**2013 වසර තුළ පුහුණු වැඩසටහන් සඳහා සහභාගි කරවීම**

| | පුහුණු වැඩසටහන | සහභාගිත්වය |
|---|---|---|
| 01 | Cabinet Paper Writing | **02** |
| 02 | Essence of Public Procurements | **02** |
| 03 | Bid Evaluation | 02 |
| 04 | Annual Stock Verification & Disposal Procedure | **01** |
| 05 | Business Writing for Administration Professional | 01 |
| 06 | ව්‍යාපෘති යෝජනා සකස් කිරීම | 07 |
| 07 | ප්‍රසම්පාදන ක්‍රියාවලිය | 02 |
| 08 | ඉහළ ශ්‍රම ඵලදායිතාවය සඳහා කාර්යාල කාර්ය සහාක කාර්යභාරය | 25 |
| 09 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය | 06 |
| 10 | Practical Aspects of Bid Evaluation | 01 |
| 11 | Work shop on Developing Management Assistants | 40 |
| 12 | Maintain of Personal File | 08 |

## 2.4 2013 වසර තුළ අමාත්‍යාංශයෙන් ස්ථාන මාරුවීම් / විශ්‍රාම ලබාගිය නිලධාරි සංඛ්‍යාව පහත දක්වා ඇත.

### 2.4.1. ස්ථාන මාරුවීම්

| | නම | සේවය |
|---|---|---|
| 01 | එන්.පී.ජී. දයානන්ද මයා | II "අ" රියැදුරු |
| 02 | කීර්ති පනාගොඩ මයා | කා.සේ.සේ. I |
| 03 | තනුජා නිරෝෂනී මෙය | කා.සේ.සේ. III (තනතුරින් මුදා හැර ඇත) |
| 04 | එච්.එම්. රවීන්ද්‍ර කුමාර මයා | කා.සේ.සේ. III |
| 05 | එල්.පී.ඒ.ඩී. ධර්මරත්න මයා | රා.කළ.ස.සේ.II |
| 06 | ඩබ්.එච් ශ්‍යාමලී මිය | රා.කළ.ස.සේ.III |
| 07 | ඩී.එන්.එස්.එච්. කොඩිතුවක්කු මයා | රා.කළ.ස.සේ.II |
| 08 | පී.එස්.එස්. හේවාවිතාරණ මිය | රා.කළ.ස.සේ.I |
| 09 | කේ.එම්.සී උදේශිකා මිය | රා.කළ.ස.සේ.III |
| 10 | එස්.ඒ.සී. වීරසිංහ මිය | රා.කළ.ස.සේ.III |
| 11 | එම්.එස්.අතුකෝරළ මිය | රා.කළ.ස.සේ.III |
| 12 | එම්.ඩබ්.පී.එම්. විතාරණ මිය | රා.කළ.ස.සේ.III |

### 2.4.2. විශ්‍රාම ලබාගැනීම

| | නම | සේවය |
|---|---|---|
| 01 | එම්.ඒ.එන්.රබෙල් | II "අ" රියදුරු |

# 2.අ. සංස්කෘතික මධ්‍යස්ථාන පාලනය

සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති සියළුම සංස්කෘතික මධ්‍යස්ථාන වල පරිපාලන කටයුතු ක්‍රියාත්මක කරලීම හා අධීක්ෂණ ක්‍රියාවලිය මධ්‍යස්ථාන පාලන අංශය මගින් සිදු කෙරේ.

**සංස්කෘතික මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලය - 2013**

| | | |
|---|---|---|
| I. | සංස්කෘතික ප්‍රවර්ධන නිලධාරී | - 184 |
| II. | සංවර්ධන නිලධාරී | - 122 |
| III. | සහකාර සංස්කෘතික ප්‍රවර්ධන නිලධාරී | - 156 |
| IV. | මධ්‍යස්ථාන කාර්යාල කාර්ය සහායක | - 174 |
| V. | මධ්‍යස්ථාන මුරකරු | - 171 |
| VI. | අනියම් කාර්යාල කාර්ය සහායක | - 05 |
| VII. | අනියම් මුරකරු | - 08 |
| VIII. | ආදේශක මුරකරු | - 177 |

## කාර්යභාරය - 2013

1. ඉහත අංක I සිට V දක්වා වූ තනතුරුවලට අදාල පෞද්ගලික ලිපි ගොනු යාවත්කාලීනව පවත්වාගෙන යාම
2. අනියම් තනතුරු සඳහා ලිපිගොනු පවත්වාගෙන යාම
3. සංස්කෘතික මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලයේ සියලුම නිවාඩු වාර්ථා යාවත්කාලීනව පවත්වාගෙන යාම
4. ණය ලිපිගොනු පවත්වාගෙන යාම
   - i. ආපදා ණය ගෙවීම් 75
   - ii. දේපළ ණය ගෙවීම් 19
   - iii. උත්සව අත්තිකාරම් ගෙවීම් 525 (ගෙවා ඇති මුදල රු.2,625,000/=)
   - iv. විශේෂ අත්තිකාරම් 48 (ගෙවා ඇති මුදල රු. 120,000/=)
5. වාර්ෂික ස්ථානමාරු කිරීම් සම්බන්ධ රාජකාරි කටයුතු සිදු කිරීම
   2013 වර්ෂයේ ක්‍රියා කරන ලද ස්ථාන මාරු අයඳුම්පත් ගණන
   - i. සංස්කෘතික ප්‍රවර්ධන නිළධාරීන් ඉල්ලුම්පත් 48
   - ii. සහකාර සංස්කෘතික ප්‍රවර්ධන නිළධාරීන් ඉල්ලුම්පත් 39
   - iii. මධ්‍යස්ථාන කාර්ය සහායක ඉල්ලුම්පත් 22
6. අග්‍රහාර රක්ෂණ ගෙවීම් - 92
7. කාර්ය මණ්ඩලයේ විනය පරීක්ෂණ සම්බන්ධව කටයුතු සිදු කිරීම
   - i. විනය පරීක්ෂණ - 02, අවවාද කිරීම් - 05
   - ii. අභ්‍යන්තර විගණන පරීක්ෂණ - ලැබීම් 38, පිළිතුරු සැපයීම් - 35
   - iii. මධ්‍යස්ථාන හදිසි පරීක්ෂාවන් - 03
8. කාර්ය මණ්ඩලය සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීම

| | | |
|---|---|---|
| i. | කාර්යාල කාර්ය සහායක | 10 |
| ii. | මුරකරු | 14 |
| iii. | සංස්කෘතික ප්‍රවර්ධන නිළධාරි | 13 |
| iv. | සහකාර සංස්කෘතික ප්‍රවර්ධන නිළධාරි | 13 |

9. සංස්කෘතික ප්‍රවර්ධන නිලධාරීන් හා සහකාර සංස්කෘතික ප්‍රවර්ධන නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයක් පැවැත්වීම
10. කාර්ය මණ්ඩල බඳවා ගැනීම්

| | | |
|---|---|---|
| i. | මුරකරු | 30 |
| ii. | කාර්යාල කාර්ය සහායක | 34 |
| iii. | ආදේශ මුරකරු | 27 |

# 3. 2013 මූල්‍ය කටයුතු

## 3.1 සංස්කෘතික අමාත්‍යාංශ වැඩසටහන් පිළිබඳ වියදම්

### 3.1.1 පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම්

| අංකය | විස්තරය | 2013 වර්ෂය සඳහා ප්‍රතිපාදන රු. | 2013.12.31 දිනට වියදම රු. | වියදම් ප්‍රතිශතය % |
|---|---|---|---|---|
| 01 | පුනරාවර්තන වියදම | | | |
| 1. 1 | අමාත්‍ය කාර්යාලය සහ අමාත්‍යාංශ පරිපාලනය | 141,815,000.00 | 133,757,385.86 | 94% |
| 1. 2 | සමාජ සංස්කෘතික ඒකාබද්ධතා කටයුතු | 492,665,000.00 | 428,779,332.73 | 87% |
| | උප එකතුව | **634,480,000.00** | **562,536,718.59** | 89% |
| 02 | ප්‍රාග්ධන වියදම් | | | |
| 2. 1 | අමාත්‍ය කාර්යාලය සහ අමාත්‍යාංශ පරිපාලනය | 22,400,000.00 | 21,811,839.63 | 97% |
| 2. 2 | සමාජ සංස්කෘතික ඒකාබද්ධතා කටයුතු | 507,000,000.00 | 451,872,617.17 | 89% |
| | උප එකතුව | **529,400,000.00** | **473,684,456.80** | **89%** |
| | මුළු එකතුව | **1,163,880,000.00** | **1,036,221,175.39** | **89%** |

### 3.1.2. පුනරාවර්තන වියදම් විස්තර

➢ සේවක වැටුප් පිළිබඳ වියදම් හා වැටුප් සමග ගෙවනු ලබන ජීවන අංක දීමනාව

| වැය විෂය | විස්තරය | 2013 වර්ෂය සඳහා ප්‍රතිපාදන රු. | 2013.12.31 දිනට වියදම රු. | වියදම් ප්‍රතිශත % |
|---|---|---|---|---|
| සේවක වැටුප් පිළිබඳ වියදම | | | | |
| 177-1-1-1001 | අමාත්‍ය කාර්යාලය | 5,450,000.00 | 5,450,000.00 | 100% |
| 177-1-2-1001 | අමාත්‍යාංශ පරිපාලනය | 31,000,000.00 | 31,000,000.00 | 100% |
| 177-2-3-1001 | සමාජ සංස්කෘතික ඒකාබද්ධතා කටයුතු | 120,000,000.00 | 120,000,000.00 | 100% |
| | උප එකතුව | **156,450,000.00** | **156,450,000.00** | 100% |
| අතිකාල හා නිවාඩු දින වැටුප් | | | | |
| 177-1-1-1002 | අමාත්‍ය කාර්යාලය | 1,500,000.00 | 1,191,430.00 | 79% |
| 177-1-2-1002 | අමාත්‍යාංශ පරිපාලනය | 2,000,000.00 | 1,276,824.50 | 64% |
| 177-2-3-1002 | සමාජ සංස්කෘතික ඒකාබද්ධතා කටයුතු | 7,500,000.00 | 7,500,000.00 | 100% |
| | උප එකතුව | **11,000,000.00** | **9,968,254.50** | **91%** |
| වැටුප් සමග ගෙවනු ලබන දීමනා | | | | |
| 177-1-1-1003 | අමාත්‍ය කාර්යාලය | 2,100,000.00 | 2,100,000.00 | 100% |
| 177-1-2-1003 | අමාත්‍යාංශ පරිපාලනය | 13,500,000.00 | 13,500,000.00 | 100% |
| 177-2-3-1003 | සමාජ සංස්කෘතික ඒකාබද්ධතා කටයුතු | 67,600,000.00 | 67,599,994.00 | 100% |
| | උප එකතුව | **83,200,000.00** | **83,199,994.00** | **100%** |
| | මුළු එකතුව | **250,650,000.00** | **249,618,248.50** | **100%** |

- වෙනත් පුනරාවර්තන වියදම්

| වැය විෂය | විස්තරය | 2013 වර්ෂය සඳහා ප්‍රතිපාදන රු. | 2013.12.31 දිනට වියදම රු. | වියදම් ප්‍රතිශත % |
|---|---|---|---|---|
| ගමන් වියදම් | | | | |
| | අමාත්‍ය කාර්යාලය | 1,700,000.00 | 1,690,195.00 | 99% |
| | අමාත්‍යාංශ පරිපාලනය | 2,000,000.00 | 2,000,000.00 | 100% |
| | සමාජ සංස්කෘතික ඒකාබද්ධතා කටයුතු | 3,500,000.00 | 3,500,000.00 | 100% |
| | **උප එකතුව** | **7,200,000.00** | **7,190,195.00** | 100% |
| සැපයීම් | | | | |
| | අමාත්‍ය කාර්යාලය | 7,850,000.00 | 7,202,751.34 | 92% |
| | අමාත්‍යාංශ පරිපාලනය | 8,400,000.00 | 7,898,901.18 | 94% |
| | සංස්කෘතික ප්‍රවර්ධන කටයුතු | 8,500,000.00 | 8,114,284.11 | 95% |
| | **උප එකතුව** | **24,750,000.00** | **23,215,936.63** | **94%** |
| නඩත්තු වියදම් | | | | |
| | අමාත්‍ය කාර්යාලය | 2,900,000.00 | 2,789,893.97 | 96% |
| | අමාත්‍යාංශ පරිපාලනය | 5,700,000.00 | 3,989,635.84 | 70% |
| | සමාජ සංස්කෘතික ඒකාබද්ධතා කටයුතු | 2,200,000.00 | 2,200,000.00 | 100% |
| | **උප එකතුව** | **10,800,000.00** | **8,979,529.81** | **83%** |
| සේවා | | | | |
| | අමාත්‍ය කාර්යාලය | 4,600,000.00 | 4,265,045.09 | 93% |
| | අමාත්‍යාංශ පරිපාලනය | 52,115,000.00 | 48,689,506.51 | 93% |
| | සමාජ සංස්කෘතික ඒකාබද්ධතා කටයුතු | 9,900,000.00 | 9,546,467.78 | 96% |
| | **උප එකතුව** | **66,615,000.00** | **62,501,019.38** | **94%** |
| රජයේ සේවකයින් සඳහා දේපළ ණය පොළී | | | | |
| | අමාත්‍යාංශ පරිපාලනය | 1,000,000.00 | 713,202.43 | 71% |
| | සමාජ සංස්කෘතික ඒකාබද්ධතා කටයුතු | 1,500,000.00 | 1,500,000.00 | 100% |
| | **උප එකතුව** | **2,500,000.00** | **2,213,202.43** | **88%** |
| | විදේශ සබඳතා | 17,705,000.00 | 17,411,859.79 | 98% |
| | ජාතික සාහිත්‍ය කලා උත්සවය | 5,000,000.00 | 5,000,000.00 | 100% |
| | සමාජ ඒකාබද්ධතා | 6,000,000.00 | 5,994,760.76 | 100% |
| | ප්‍රසිද්ධ රඟම්පාලක මණ්ඩලය | 4,000,000.00 | 4,000,000.00 | 100% |
| | ටවර් හෝල් රඟහල පදනම | 40,000,000.00 | 25,200,000.00 | 63% |
| | මධ්‍යම සංස්කෘතික අරමුදල | 10,160,000.00 | 275,689.53 | 3% |
| | සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානයට දායක මුදල් | 29,000,000.00 | 24,000,000.00 | 83% |
| | රාජ්‍ය ආයතනවල සංස්කෘතික කටයුතු නංවාලීම | 1,500,000.00 | 1,500,000.00 | 100% |
| | දඹාන ජන උරුම කේන්ද්‍රය නඩත්තු කිරීම | 1,300,000.00 | 1,300,000.00 | 100% |
| | සංස්කෘතික මධ්‍යස්ථාන නඩත්තු කිරීම | 126,300,000.00 | 119,034,396.76 | 93% |
| | ශ්‍රී ලංකා කලා මණ්ඩලය | 6,000,000.00 | 5,101,880.00 | 85% |
| මුළු එකතුව | | **358,830,000.00** | **312,918,470.09** | **87%** |

### 3.1.3. ප්‍රාග්ධන වියදම් විස්තර

➢ ගෘහ භාණ්ඩ , කාර්යාලීය උපකරණ හා යන්ත්‍ර සහ යන්ත්‍ර උපකරණ මිළදී ගැනීම

| වැය විෂය | විස්තරය | 2013 වර්ෂය සඳහා ප්‍රතිපාදන රු. | 2013.12.31 දිනට වියදම රු. | වියදම් ප්‍රතිශය % |
|---|---|---|---|---|
| ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ භාණ්ඩ මිළදී ගැනීම | | | | |
| 177-1-1-2102 | අමාත්‍ය කාර්යාලය | 1,000,000.00 | 612,752.40 | 61% |
| 177-1-2-2101 | වාහන | 6,700,000.00 | 6,700,000.00 | 100% |
| 177-1-2-2102 | අමාත්‍යාංශ පරිපාලනය | 1,000,000.00 | 1,000,000.00 | 100% |
| 177-2-3-2102 | සමාජ සංස්කෘතික ඒකාබද්ධතා කටයුතු | 30,000,000.00 | 29,515,160.24 | 98% |
| | **උප එකතුව** | **38,700,000.00** | **37,827,912.64** | **98%** |
| යන්ත්‍ර සහ යන්ත්‍ර උපකරණ මිළදී ගැනීම | | | | |
| 177-1-1-2103 | අමාත්‍ය කාර්යාලය | 1,000,000.00 | 1,000,000.00 | 100% |
| 177-1-2-2103 | අමාත්‍යාංශ පරිපාලනය | 3,000,000.00 | 3,000,000.00 | 100% |
| 177-2-3-2103 | සමාජ සංස්කෘතික ඒකාබද්ධතා කටයුතු | 5,000,000.00 | 3,381,959.00 | 68% |
| | **උප එකතුව** | **9,000,000.00** | **7,381,959.00** | **82%** |
| | **මුළු එකතුව** | **47,700,000.00** | **45,209,871.64** | **95%** |

➢ යන්ත්‍ර සහ යන්ත්‍ර උපකරණ, ගොඩනැගිලි හා වාහන අලුත්වැඩියාවන් වෙනුවෙන් වැය වූ මුදල්

| වැය විෂය | විස්තරය | 2013 වර්ෂය සඳහා ප්‍රතිපාදන රු. | 2013.12.31 දිනට වියදම රු. | වියදම් ප්‍රතිශතය % |
|---|---|---|---|---|
| ගොඩනැගිලි ඉදිකිරීම් හා නඩත්තු කටයුතු සඳහා වැයවූ මුදල් | | | | |
| 177-1-1-2001 | අමාත්‍ය කාර්යාලය | 2,500,000.00 | 2,500,000.00 | 100% |
| 177-1-2-2001 | අමාත්‍යාංශ පරිපාලනය | 200,000.00 | 200,000.00 | 100% |
| 177-2-3-2001 | සමාජ සංස්කෘතික ඒකාබද්ධතා කටයුතු | 105,600,000.00 | 105,600,000.00 | 100% |
| | උප එකතුව | **108,300,000.00** | **108,300,000.00** | **100%** |
| යන්ත්‍ර සහ යන්ත්‍ර උපකරණ අලුත්වැඩියාවන් වෙනුවෙන් වැය වූ මුදල් | | | | |
| 177-1-1-2002 | අමාත්‍ය කාර්යාලය | 300,000.00 | 181,178.73 | 60% |
| 177-1-2-2002 | අමාත්‍යාංශ පරිපාලනය | 300,000.00 | 300,000.00 | 100% |
| 177-2-3-2002 | සමාජ සංස්කෘතික ඒකාබද්ධතා කටයුතු | 1,000,000.00 | 1,000,000.00 | 100% |
| | උප එකතුව | **1,600,000.00** | **1,481,178.73** | **93%** |
| වාහන අලුත්වැඩියාවන් වෙනුවෙන් වැය වූ මුදල් | | | | |
| 177-1-1-2003 | අමාත්‍ය කාර්යාලය | 2,300,000.00 | 2,300,000.00 | 100% |
| 177-1-2-2003 | අමාත්‍යාංශ පරිපාලනය | 3,500,000.00 | 3,500,000.00 | 100% |
| 177-2-3-2003 | සමාජ සංස්කෘතික ඒකාබද්ධතා කටයුතු | 3,500,000.00 | 3,500,000.00 | 100% |
| | උප එකතුව | **9,300,000.00** | **9,300,000.00** | **100%** |
| | මුළු එකතුව | **119,200,000.00** | **119,081,178.73** | **100%** |

- අනුබද්ධ ආයතන, ව්‍යාපෘති හා පුහුණු වෙනුවෙන් වැය වූ මුදල්

| වැය විෂය | විස්තරය | 2013 වර්ෂය සඳහා ප්‍රතිපාදන රු. | 2013.12.31 දිනට වියදම රු. | වියදම් ප්‍රතිශතය % |
|---|---|---|---|---|
| අනුබද්ධ ආයතන වෙනුවෙන් වැය වූ මුදල් | | | | |
| 177-2-3-5-2502 | ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය | 2,000,000.00 | 2,000,000.00 | 100% |
| 177-2-3-6-2502 | ටවර් හෝල් රඟහල පදනම | 20,000,000.00 | 6,825,000.00 | 34% |
| | **උප එකතුව** | **22,000,000.00** | **8,825,000.00** | **9%** |
| ප්‍රධාන ව්‍යාපෘති වෙනුවෙන් වැය වූ මුදල් | | | | |
| 177-2-3-2001 | ගොඩනැගිලි හා ඉදිකිරීම් (සංස්කෘතික මධ්‍යස්ථාන) | 105,600,000.00 | 105,600,000.00 | 100% |
| 177-2-3-7-2502 | පවත්නා අන්තර්ජාල පහසුකම් වැඩිදියුණු කිරීම | 500,000.00 | 498,275.00 | 100% |
| 177-2-3-8-2502 | වයඹ සංස්කෘතික චතුරශ්‍ර ව්‍යාපෘතිය | - | - | - |
| 177-2-3-9-2502 | දේශීය සාම්ප්‍රදායික දැණුම හා සංස්කෘතික වටිනාකම් නිරාවරණය හා සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය | 2,000,000.00 | 1,884,106.25 | 94% |
| 177-2-3-12-2502 | සංස්කෘතික මධ්‍යස්ථාන පහසුකම් වැඩිදියුණු කිරීම | 30,000,000.00 | 29,998,506.10 | 100% |
| 177-2-3-15-2502 | එල්ෆින්ස්ටන් රඟහල නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය | 50,000,000.00 | 17,504,572.00 | 35% |
| 177-2-3-16-2502 | සංස්කෘතික ක්‍රියාකාරකම් සඳහා වන සේවස්ථ පුහුණු මධ්‍යස්ථානය වැඩි දියුණු කිරීම | 2,000,000.00 | 1,373,041.49 | 69% |
| 177-2-3-17-2502 | ආදිවාසී ගම්මාන සංරක්ෂණය | 10,000,000.00 | 6,000,454.99 | 60% |
| 177-2-3-18-2502 | සංස්කෘතික මධ්‍යස්ථානය හා සුනාමි පර්යේෂණ මධ්‍යස්ථානය ඉදිකිරීම | 16,000,000.00 | 15,903,896.60 | 99% |
| 177-2-3-21-2502 | සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීම | 224,000,000.00 | 224,000,000.00 | 100% |
| 177-2-3-24-2502 | ශිල්ප ගම්මාන වැඩසටහන | 1,400,000.00 | 1,344,556.00 | 96% |
| | **උප එකතුව** | **441,500,000.00** | **404,107,408.43** | **91%** |
| **පුහුණු කිරීම් හා හැකියා වර්ධනය** | | | | |
| 177-01-02-2401 | අමාත්‍යාංශ පරිපාලනය | 600,000.00 | 517,908.50 | 86% |
| 177-02-03-2401 | සමාජ සංස්කෘතික ඒකාබද්ධතා කටයුතු | 4,000,000.00 | 1,543,089.50 | 39% |
| | **උප එකතුව** | **4,600,000.00** | **2,060,998.00** | **45%** |
| | මුළු එකතුව | **468,100,000.00** | **414,993,406.43** | **90%** |

## 3.2 රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් බී ගිණුමට අදාළ විස්තර

| ණය වර්ගය | ණය ලබාගෙන ඇති නිලධාරින් ගණන | වැය වූ මුදල රු. |
|---|---|---|
| ආපදා ණය | 146 | 12,730,324.00 |
| උත්සව අත්තිකාරම් | 651 | 3,255,000.00 |
| විශේෂ අත්තිකාරම් | 91 | 227,500.00 |
| ගංවතුර අත්තිකාරම් | - | - |
| පාපැදි ණය | - | - |
| | එකතුව | **16,212,824.00** |

# 4. සංස්කෘතික ප්‍රවර්ධනය

## 4.1 සංස්කෘතික මධ්‍යස්ථාන වැඩසටහන

### I. සංස්කෘතික මධ්‍යස්ථාන පාඨමාලා

2013.12.31 වන විට දිවයින පුරා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සංස්කෘතික මධ්‍යස්ථාන 165 ක් පිහිටුවා ඇත. මෙම සංස්කෘතික මධ්‍යස්ථාන මගින් උඩරට, පහතරට,සබරගමු සහ ජන නැටුම්, පෙරදිග සහ අපරදිග සංගීතය, නාට්‍ය හා රංග කලාව, චිත්‍ර, මූර්ති සහ කැටයම් කලාව, කායික හා මානසික වර්ධනය, අත්කම් නිපැයුම් හා සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂාවන්ද පාලි හා සංස්කෘතික භාෂාවන් යන පාඨමාලා නොමිලේ පවත්වනු ලැබේ.

2013 වර්ෂයේ සංස්කෘතික මධ්‍යස්ථාන පුහුණුව ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව - 48,369 කි.

### II. ජාතික සහ ප්‍රාදේශීය සංස්කෘතික වැඩසටහන් සඳහා සංස්කෘතික මධ්‍යස්ථාන දායකත්වය

සංස්කෘතික මධ්‍යස්ථාන මගින් ප්‍රදේශයේ සියලුම වයස් කණ්ඩායම්වල සහභාගීත්වයෙන් සහ ප්‍රදේශයේ අනුග්‍රාහකයන්ගේ දායකත්වයෙන් සාරධර්ම පිරි සමාජයක් බිහිකිරීම අරමුණු කරගෙන වාර්ෂිකව නිදහස් උත්සවය,අලුත් අවුරුදු උත්සවය, සාහිත්‍ය කාල මහෝත්සවය, ආගමික හා සංස්කෘතික උත්සව ආදී ජාතික උත්සවවලට සමගාමීව එම ප්‍රදේශවලද උත්සව පවත්වනු ලබයි. .

### III. සංස්කෘතික මධ්‍යස්ථාන පුස්තකාල සේවාව

සංස්කෘතික මධ්‍යස්ථාන ආශ්‍රිත ග්‍රාමීය ජනතාවගේ හා සංස්කෘතික මධ්‍යස්ථානවල පාඨමාලා හැදෑරීම සඳහා පැමිණෙන සිසුන්ගේ කියවීමේ පුරුද්ද සහ සාහිත්‍ය රසවින්දන හැකියාව දැනුම අවබෝධය වැඩි දියුණු කිරීම අරමුණු කරගෙන පුස්තකාල සේවය ක්‍රියාත්මක කරනු ලබයි.

පසුගිය වසරේ ප්‍රකාශයට පත් වැදගත් සාහිත්‍ය කෘති අතුරින් කමිටුවක් මගින් තෝරා ගනු ලබන( සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන්) පොත් කට්ටලයක් වාර්ෂිකව දිවයින පුරා පිහිටි සංස්කෘතික මධ්‍යස්ථාන පුස්තකාල සඳහා බෙදා දෙනු ලැබේ. 2013 වර්ෂයේදී රු.මි. 06 ක වියදමින් පොත් මිලදී ගෙන සංස්කෘතික මධ්‍යස්ථාන අතර බෙදා හරින ලදී.

**සංස්කෘතික මධ්‍යස්ථාන තුළ පිහිටුවා ඇති පුස්තකාල පාඨක සංඛ්‍යාව**

**2013 – 43,363**

**ප්‍රවාහන අපහසුතා පවතින ප්‍රදේශවල පිහිටි සංස්කෘතික මධ්‍යස්ථානවල ත්‍රී රෝද රථ හා පාපැදි මඟින් ජංගම පුස්තකාල සේවයක් ක්‍රියාත්මක කරනු ලබයි.**

2013 වර්ෂයේ ජංගම පුස්තකාල සේවය ක්‍රියාත්මක සංස්කෘතික මධ්‍යස්ථාන ගණන 14 වන අතර පාඨක සංඛ්‍යාව 981 කි.

| පළාත | | සංස්කෘතික මධ්‍යස්ථාන | පාඨක සංඛ්‍යාව |
|---|---|---|---|
| මධ්‍යම | 01 | උඩුදුම්බර | 50 |
| නැගෙනහිර | 02 | පුත්තලම | 25 |
| වයඹ | 03 | කරුවලගස්වැව | 50 |
| | 04 | ආණමඩුව | 55 |
| | 05 | ගල්ගමුව | 80 |
| | 06 | වාරියපොල | 30 |
| | 07 | පොල්පිතිගම | 45 |
| | 08 | මල්ලවපිටිය | 10 |
| | 09 | ගිරිබාව | 75 |
| | 10 | මහවැව | 200 |
| සබරගමුව | 11 | බලන්ගොඩ | 250 |
| දකුණ | 12 | බෙලිඅත්ත | 56 |
| ඌව | 13 | පස්සර | 30 |
| නැගෙනහිර | 14 | පදවි ශ්‍රී පුර | 25 |
| **සංස්කෘතික මධ්‍යස්ථාන ගණන - 14** | | | **981** |

## IV. දේශීය නර්තන ශිල්පී සංචිතය

සංස්කෘතික මධ්‍යස්ථාන වලින් නර්තන පාඨමාලා මැනවින් හදාරා දක්ෂතා පෙන්වන ලද ශිල්පීන්ගෙන් සමන්විත නර්තන සංචිතයක් 2013 වර්ෂයේ දී ද පවත්වා ගෙන යන ලදී.

| නර්තන අංගය | ශිල්පීන් ගණන | |
|---|---|---|
| | නර්තන ඇඳුම් /භාණ්ඩ සහිතව | නර්තන ඇඳුම් /භාණ්ඩ රහිතව |
| වෙස් නැටුම් | **500** | **1,000** |
| ශාස්ත්‍රීය කාන්තා | **300** | **1,000** |
| පහතරට නර්තන අංග | | |
| පහත රට නැටුම් කාන්තා | **100** | **400** |
| තෙල්මේ | **50** | **450** |
| කෝලම්, සන්නි හා පාලි - වර්ග 03 | **60** | **200** |
| සබරගමු නැටුම් කාන්තා | **200** | **400** |
| සබරගමු නැටුම් පිරිමි | **100** | **250** |
| ගැමි නර්තන අංග 20 ක් හා කණ්ඩායම් 25 කින් යුක්තය | | |
| | ශිල්පීන් 40 බැගින් සිටින කණ්ඩායම් 12 | කණ්ඩායම් 50 |
| බෙර වාදන ශිල්පීන් | **1,500** | **2,000** |
| | | |

### 4.2 සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය දායකත්වය දැක් වූ ජාතික වැඩසටහන් සහ පවත්වන ලද විශේෂ වැඩසටහන්

| දිනය | වැඩ සටහන හා පැවැත්වූ ස්ථානය | අමාත්‍යාංශයේ දායකත්වය / සහභාගීත්වය |
|---|---|---|
| 2013.01.12 | "අභිෂෙස්" උපාධිධාරී සමුළුව - සුගතදාස ශෘහස්ථ ක්‍රීඩාංගනය | බෙර වාදන ශිල්පීන් 500 ක්-සහභාගි කරවීම |
| 2013.01.26 | නිකවැරටිය බුදුමුත්තාරාම රජ මහා විහාරස්ථානයේ පෙරහැර | නර්තන ශිල්පීන් 65 ක් ලබාදීම |
| 2013.02.04 | 65 වන ජාතික නිදහස් දින සමරු උළෙල ත්‍රිකුණාමලය | නර්තන පෙරහැර සඳහා නැටුම් කණ්ඩායම් 11ක් හා මධ්‍යස්ථාන ළමුන් 715ක් සහභාගි කරවීම |
| 2013.02.21 | ලෝක මවු භාෂා දිනය සැමරීමේ උත්සවය ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී | මධ්‍යස්ථානවල නර්තන ශිල්පීන් 20ක් ලබාදීම |
| 2013.02.22 | හොරණ - ඔලබොඩුව ශ්‍රී වර්ධනාරාම පුරාණ විහාරස්ථානය නවම් මහා පෙරහැර | නර්තන කණ්ඩායම් 05ක් සඳහා සංස්කෘතික මධ්‍යස්ථාන වල නර්තන ශිල්පීන් 80ක් සහභාගි කරවීම |
| 2013.02.22 | චීන ශ්‍රී ලංකා සම්බන්ධතා සංස්කෘතික ප්‍රසංගය අනුරාධපුර හරිස්චන්ද්‍ර ක්‍රීඩාංගනය | නර්තන ශිල්පීන් 110ක් ලබාදීම |

| | | |
|---|---|---|
| 2013.03.08<br><br><br><br><br>2013.03.31 | 1. ගැබිණි මාතාවන් වෙනුවෙන් "සෙනෙහස" සෞන්දර්යාත්මක රසවින්දන වැඩසටහන පැවැත්වීම - සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේදී<br>2."සෙනෙහස" ජාතික වැඩසටහන, මහනුවර කුණ්ඩසාලේ ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයේදී | ලෝක කාන්තා දිනයට සමගාමීව පවත්වන ලදී. මෙහිදී ගැබිනි මව්වරුන් වෙනුවෙන් රසවින්දන වැඩසටහනක් පවත්වන ලද අතර ත්‍යාග ලෙස බෞද්ධ වන්දනා පොතක්,ගැබිණි මව්වරුන් වෙනුවෙන්ම අමාත්‍යාංශයෙන් පළකරනලද "සෙනෙහස" ග්‍රන්ථය,ළදරු මදුරු දැල්, පළතුරු වට්ටියක්, වීත්තයක් හා පැනල් රෙද්දක් ලබා දෙන ලදී.<br>අමාත්‍යාංශ වැඩසටහන සඳහා ගැබිනි මව්වරුන් 75 ක් ද ජාතික වැඩසටහන සඳහා ගැබිනි මව්වරුන් 1200ක්ද සහභාගි වන ලදී. මීට අමතරව ප්‍රාදේශීය සංස්කෘතික මධ්‍යස්ථාන මට්ටමින්ද සෙනෙහස වැඩසටහන පවත්වන ලදී. |
| 2013.03.13 | වැද්දා සහ වැදි ජන නාමාවලිය එළිදැක්වීම - ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේදී | ආදිවාසී ජන සංස්කෘතිය සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ වැදි ජනයා පිළිබඳ සමාජ මානව විද්‍යාත්මක පර්යේෂණය - වැද්දා සහ වැදි ජන නාමාවලිය එළිදැක්වීම |
| 2013.03.24 –<br>2013.03.30 | දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනය අම්පාර හාඩි තාක්ෂණ ආයතයේදී | ප්‍රධාන වේදිකාවේදී ප්‍රතිභා තරගවලින් ජයග්‍රහණය කරන ලද සංස්කෘතික මධ්‍යස්ථාන නර්තන කණ්ඩායම් 18ක ප්‍රසංග ඉදිරිපත් කිරීම.<br>ප්‍රදර්ශන කුටිය සමග වූ වේදිකාවේ දී සෑම දිනකම සංස්කෘතික මධ්‍යස්ථාන ශිල්පීන්ගේ සංදර්ශන පැවැත්වීම.<br>පාරම්පරික අංගම් ශිල්පීන්ගේ සංදර්ශනයක් පැවැත්වීම. |
| 2013.03.10 | උත්තම පූජා පුණ්‍ය මහෝත්සවය | මහව, බලල්ල, වල්සෑගල පුරාණ විහාරස්ථානයේ පැවති පුණ්‍ය මහෝත්සවය සඳහා බෙර වාදන සහ නර්තන ශිල්පීන් 103 දෙනෙක් සහභාගි කරවීම. |
| 2013.03.18 | මත්තල ගුවන් තොටුපල විවෘත කිරීමේ උත්සවය | විවෘත කිරීමේ උත්සවය සඳහා බෙර ශිල්පීන් 200ක් සහභාගි කරවීම. |
| 2013.04.06 | සිංහල හින්දු අළුත් අවුරුදු නැකැත් සීට්ටුව අතිගරු ජනාධිපතිතුමාට පිළිගැන්වීම | 2013 වසරේ සිංහල හින්දු අළුත් අවුරුදු උත්සවයේ නැකැත් සීට්ටුව 2013.04.06 දින අතිගරු ජනාධිපතිතුමන්ට පිළිගන්වන ලදී. සංස්කෘතික මධ්‍යස්ථාන මගින් ප්‍රාදේශීය ජනතාව අතර නැකැත් සීට්ටු 100,000 ක් බෙදා හරින ලදී. |
| 2013.04.17 | සිංහල හින්දු අළුත් අවුරුදු උත්සවය පැවැත්වීම | 2013.04.17 වන දින බත්තරමුල්ල ජන කලා කේන්ද්‍රයේදී ගරු සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් සිංහල හින්දු ජන ක්‍රීඩා පෙරටු කරගත් අවුරුදු උත්සවයක් පවත්වන ලදී. |
| 2013.05.24 | රාජ්‍ය වෙසක් උත්සවය - බුත්තල යුදගනා පුරාණ රජමහා විහාරය | බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය සංවිධානය කරන ලද රාජ්‍ය වෙසක් උත්සවයේ සංස්කෘතික ප්‍රසංගය අමාත්‍යාංශය විසින් පවත්වන ලදී. එහිදී සිදුහත් සිරිත මුද්‍රා නාට්‍ය ශිල්පීන් 57 දෙනෙකුගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී. |

| | | |
|---|---|---|
| **2013.06.20** | වවුනියාව සම්බුද්ධරාජ ප්‍රතිමාව සඳහා මුල්ගල තැබීමේ උත්සවය | වවුනියාව සම්බුද්ධරාජ ප්‍රතිමාව සඳහා මුල්ගල තැබීමේ උත්සවයේ පෙරහැර සඳහා නර්තන ශිල්පීන් 60 ක් ලබාදීම. |
| 2013.06.21 | තිස්සමහාරාම රජමහා විහාරයේ පෙරහැර | තිස්සමහාරාම රජමහා විහාරයේ පෙරහැර සඳහා ශිල්පීන් 80කින් යුත් නර්තන කණ්ඩායමක් සැපයීම |
| 2013.06.23 | නිකවැරටිය සමදරාපිටිය විහාර පෙරහැර | නිකවැරටිය සමදරාපිටිය විහාර පෙරහැර සඳහා ශිල්පීන් 110 කින් යුත් නර්තන කණ්ඩායම් සැපයීම |
| 2013.06.24<br><br>2013.06.27 | පොසොන් උත්සවය -මහව<br><br>පොසොන් උත්සවය -හක්මන | මහව පොසොන් කලාපයේ සංස්කෘතික ප්‍රසංගය සඳහා අමාත්‍යාංශයේ දායකත්වය ලබා දෙන ලදී.<br><br>හක්මන පොසොන් කලාපයේ සංස්කෘතික ප්‍රසංගය සඳහා අමාත්‍යාංශය විසින් අනුග්‍රහය ලබා දී සංස්කෘතික අංග ඉදිරිපත් කරනු ලැබිය. |
| 2013.07.06 | මොරගහහේන ශ්‍රී පූර්වාරාම විහාර පෙරහැර | මොරගහහේන ශ්‍රී පූර්වාරාම විහාර පෙරහැර සඳහා ශිල්පීන් 60ක් සහභාගි කරවන ලදී. |
| 2013.08.19 | තායිලන්ත රජ කුමරිය පිළිගැනීම | බෙර වාදන ශිල්පීන් 25 කින් සමන්විත කණ්ඩායමක් විසින් පිළි ගැනීම සිදු කරන ලදී. |
| 2013.10.27 | කොළඹ කටුනායක අධිවේගී මාර්ගය විවෘත කිරීම | බෙර ශිල්පීන් 300ක් හා වෙස් කණ්ඩායම් 02ක් සහභාගි කරවන ලදී. |
| 2013.11.15 | පොදු රාජ්‍ය මණ්ඩල රාජ්‍ය නායක සමුළුව | බෙර ශිල්පීන් 300ක් හා සේසත් 400ක් ලබා දෙන ලදී. |
| 2013.12.13 | අන්තර් රාජ්‍ය සේවක නිර්මාණ තරඟාවලියේ සම්මාන ප්‍රදානෝත්සවය - කොළඹ ජාතික කෞතුකාගාර ශ්‍රවනාගාරය | මෙවර අන්තර් රාජ්‍ය සේවක නිර්මාණ තරඟාවලිය සඳහා සිංහල මාධ්‍යයෙන් නිර්මාණ 1405 ක් ද දෙමළ මාධ්‍යයෙන් නිර්මාණ 418ක් ද ඉදිරිපත් කර තිබුණි. |
| 2013.12.24 | නත්තල් දින සැමරුම් උත්සවය පැවැත්වීම- සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය | සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලයේ සහභාගීත්වයෙන් පවත්වන ලදී. |

## 4.3 ලෝක ආදිවාසී දිනය සැමරීම 2013

අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් අම්පාර, දෙහිඅත්තකණ්ඩිය, හෙනානිගලදී 2013 අගෝස්තු 08 හා 09 යන දෙදින තුළදී මෙම උත්සවය පවත්වන ලදී.

මෙම උත්සවයේදී ආදිවාසීන් සඳහා පහත සඳහන් ප්‍රධානයන් සිදු කරන ලදී.

| අයිතමයන් | ප්‍රමාණය |
|---|---|
| **කිරි ගවයන්** | 07 |
| **මී මැසි පෙට්ටි (ජනපද සහිතව)** | 20 |
| **ධීවර දැල්** | 145 |
| **ඔරු** | 75 |
| **උදළු** | 625 |
| **කැති** | 225 |
| **පොරව** | 325 |
| **දියර ඉසින උපකරණ** | 04 |
| **වතුර මෝටර්** | 04 |
| **විල්බැරෝ** | 05 |

ආදිවාසී නායකතුමාගේ කතා ඇතුළත් ග්‍රන්ථය සහ ආදිවාසී ජන සංස්කෘතිය සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ කොළඹ විශ්ව විද්‍යාලය විසින් සිදු කරන ලද වැදි ජනයා පිළිබඳ සමාජ හා මානව විද්‍යාත්මක පර්යේෂණය මගින් සම්පාදිත "වැද්දා" ග්‍රන්ථය අතිගරු ජනාධිපතිතුමන්ට මෙම උත්සව අවස්ථාවේ දී පිළිගන්වනු ලැබීය. ආදිවාසීන් වෙනුවෙන් වෛද්‍ය සායනයක් පැවැත්වීම, නිවාස 20 කින් සමන්විත හෙනානිගල නිවාස ව්‍යාපෘතිය විවෘත කිරීම සහ ආදිවාසීන්, දෙහිඅත්තකණ්ඩිය සංස්කෘතික මධ්‍යස්ථානය හා රාජ්‍ය නර්තන කණ්ඩායමේ සහභාගීත්වයෙන් සංස්කෘතික සංදර්ශනයක් පැවැත්වීම ද සිදුවිය.

## 4.4 "ජාතික සාහිත්‍ය කලා ප්‍රසාදිනි" 2013 ජාතික සාහිත්‍ය කලා මහෝත්සවය

සාහිත්‍ය නිර්මාණවේදීන් කලාකරුවන් ඇගයීම ප්‍රධාන තේමාව කරගත් සාහිත්‍ය කලා ප්‍රසාදිනි උළෙල, පොදු ජනතාව අතර සාහිත්‍ය සහ කලාව පිළිබඳව රුචිකත්වය වැඩිදියුණු කිරීම, ළමා පරපුරට සාහිත්‍ය හා කලාව වඩාත් සමීප කරවීම, ඔවුන්ගේ කුසලතා වර්ධනයට ඉඩකඩ සැලසීම ආදි පරමාර්ථයන් මුදුන්පත් කර ගැනීම උදෙසා වාර්ෂිකව පැවැත්වෙන ජාතික, ආගමික හා සංස්කෘතික වශයෙන් ඉතා වැදගත් ජාතික උත්සවයකි.

2013 **"ජාතික සාහිත්‍ය කලා ප්‍රසාදිනි"** ජාතික සාහිත්‍ය කලා මහෝත්සවය මතුගම සී.ඩබ්ලිව්.ඩබ්ලිව්.කන්නන්ගර ජාතික පාසලේදී 2013 ඔක්තොම්බර් මස 18,19 හා 20 යන දිනවල දී පවත්වන ලදී.

### i. "ජාතික සාහිත්‍ය කලා ප්‍රසාදිනි" උත්සවය සමන්විත වූ අංග

ii.

- දිවයිනේ ප්‍රමුඛ පොත් ප්‍රකාශකයින් හා ප්‍රාදේශීය පොත් ප්‍රකාශකයින්ගේ පොත් ප්‍රදර්ශනය
- දිවයිනේ රාජ්‍ය සම්මානලාභී වේදිකා නාට්‍ය රඟ දැක්වීම, මහා නර්තන ප්‍රසංග - සංස්කෘතික මධ්‍යස්ථාන ප්‍රතිභා තරඟාවලියේ ජාතික වටයේ ජයග්‍රාහී නර්තනාංගයන්ගෙන් සමන්විත මහා නර්තන ප්‍රසංගය,ටවර් හෝල් ශිල්පීන්, රාජ්‍ය නර්තන ශිල්පීන් සහ කළුතර දිස්ත්‍රික්කයේ කලායතන ශිල්පීන් එක්ව ඉදිරිපත් කරනු ලැබූ නර්තන ප්‍රසංගය හා දිස්ත්‍රික් සංස්කෘතික මධ්‍යස්ථාන එකමුතුව ඉදිරිපත් කරනු ලැබූ නර්තන ප්‍රසංගය
- කළුතර දිස්ත්‍රික්කයේ ලේඛක අංකුර මතුකරමින් පොත් 05ක් දොරට වැඩීම
- මතුගම කලාපයේ පාසල් 5ක පළමු වසර සිට පහ වසර දක්වා දූ පුතුන් අතරින් 50 දෙනා බැගින් සහභාගි කරගත් ළමා මණ්ඩපය නමින් ළමා ගී, ළමා නාට්‍ය හා චිත්‍ර යන අංග ඇතුළත් සෞන්දර්යාත්මක වැඩමුළු 05 ක් පවත්වන ලදී.
- දිනකට ජ්‍යොතිෂවේදීන් 20 දෙනෙකු බැගින් දින 03 පුරාම නොමිලේ ජ්‍යොතිෂ සේවා සපයන ලදී.
- "සහෘද එෆ් එම්" සංස්කෘතික ගුවන් විදුලිය මගින් පාසල් වල හා සංස්කෘතික මධ්‍යස්ථාන වල ආධුනික සන්නිවේදකයින් 100කට වැඩි පිරිසකට තම සන්නිවේදන කුසලතා වැඩිදියුණු කර ගැනීමට අවස්ථාව උදා කර දෙන ලදී.
- ගීත රසවින්දන වැඩසටහන
- ශාන්තිකර්ම වැඩසටහන
- ළමා ගී වැඩසටහන
- මතුගම කලාපයේ ඔක්තොම්බර් 18,19,20 දිනවල උපන්දින සැමරූ දරුවන් 120 දෙනෙකුට රු.1000ක් වටිනා සාහිත්‍ය හා ව්‍යාකරණ ග්‍රන්ථ ඇතුළත් පොත් කට්ටලයක් පිරිනැමීම ද සාහිත්‍ය හා සෞන්දර්ය අංශවලින් 2012 සමස්ත ලංකා හා කුසලතා මට්ටමේ ජයග්‍රහණ ලද සිසුන් 65 දෙනෙකුට රු. 2000ක් වටිනා පොත් කට්ටලයක් පිරිනැමීම

## ii. සම්මාන ප්‍රදානය

- ශ්‍රී ලංකාවේ සාහිත්‍ය හා කලා ක්ෂේත්‍රයට සුවිශේෂී මෙහෙවරක් ඉටු කළ කලාකරුවන් අතුරින් ජීවිතයේ එක් වතාවක් පමණක් හිමිකර දෙන **දේශනේත්‍ර සම්මානය** 2013 වර්යේ ද පහත සඳහන් කලාකරුවන් වෙත ප්‍රදානය කරනු ලැබීය.

**2013 දේශනේත්‍ර සම්මානලාභී කලාකරුවන්**

| | |
|---|---|
| ➢ **බර්ටි ගුණතිලක මහතා** | **රංගන ක්ෂේත්‍රය** |
| ➢ **සිරිල් වික්‍රමගේ මහතා** | **රංගන ක්ෂේත්‍රය** |
| ➢ **ස්ටැන්ලි ඕමාර් මහතා** | **සංගීත ක්ෂේත්‍රය** |
| ➢ **සරෝජනී දේවී අරුණාචලම් මහත්මිය** | **නර්තන ක්ෂේත්‍රය** |
| ➢ **වෛද්‍යවතී රාජපක්ෂ මහත්මිය** | **සාහිත්‍ය ක්ෂේත්‍රය** |

- කළුතර දිස්ත්‍රික්කය කේන්ද්‍රකොට පැවති ජාතික සාහිත්‍ය කලා ප්‍රසාදිනී උත්සවයේ දී කලාවට සුවිශේෂී මෙහෙයක් ඉටු කළ කළුතර දිස්ත්‍රික්කයේ කලාකරුවන් 10 දෙනෙක් වෙනුවෙන් **කාලතීර්ථාභිමාණී** සම්මානය ප්‍රදානය කරන ලදී.

**2013 කාලතීර්ථාභිමානී සම්මානයෙන් පිදුම් ලද කලාකරුවන්**

| | |
|---|---|
| ➢ **පූජ්‍යපාද බටුවන්ගල රාහුල ස්වාමීනවහන්සේ** | **සාහිත්‍ය ක්ෂේත්‍රය** |
| ➢ **හඳපාන්ගොඩ ඇන්ඩිසිංඤෝ මහතා** | **නර්තන ක්ෂේත්‍රය** |
| ➢ **ජේ.කේ.ඩී. පියදාස ජයනෙත්ති මහතා** | **රංගන ක්ෂේත්‍රය** |
| ➢ **ආරියපාල විජේමාන්න මහතා** | **අත් රබන්** |
| ➢ **ඒ. ඉක්බාල් මහතා** | **සාහිත්‍ය ක්ෂේත්‍රය** |
| ➢ **සෝමා ජයකොඩි මහත්මිය** | **සාහිත්‍ය ක්ෂේත්‍රය** |
| ➢ **විජේරත්න පතිරාජ මහතා** | **නාට්‍ය ක්ෂේත්‍රය** |
| ➢ **ඩී. කුමාරගේ මහතා** | **නාට්‍ය ක්ෂේත්‍රය** |
| ➢ **මද්දුමාගේ තරංග සමරවික්‍රම මහතා** | **සංගීත ක්ෂේත්‍රය** |
| ➢ **ලියනගේ ගයාන් ලියනගේ මහතා** | **මූර්ති ක්ෂේත්‍රය** |

- **ප්‍රතිභා සම්මාන හා සහතික ප්‍රදානය**

සංස්කෘතික මධ්‍යස්ථානවල සංගීතය, නර්තනය, රංගනය ආදී සෞන්දර්යාත්මක විෂයයන් හදාරණ සිසුන් තුළ විෂය ප්‍රගුණ කර ශිල්ප දැක්වීමට අවස්ථාවක් ලබාදීම, සෞන්දර්යාත්මක චරිත සංවර්ධනය හා පෞරුෂ ගුණාංග වර්ධනයත්, දේශීය සංස්කෘතිකාංග ආරක්ෂා කර ගැනීමත්, අරමුණු කර ගෙන අන්තර් සංස්කෘතික මධ්‍යස්ථාන සංගීත, නර්තන, රංගන තරඟාවලිය වාර්ෂිකව "ප්‍රතිභා" නමින් පවත්වනු ලැබේ. සෑම අංශයකින්ම ඉහල දක්ෂතා පෙන්නුම් කරණ කණ්ඩායම් ඉදිරිපත් වූ මධ්‍යස්ථානයට ශූරතාවය හා අනුශූරතාවය ප්‍රදානය කෙරේ.

2013 ප්‍රතිභා ශූරතා

ශූරතාවය - **දියතලාව සංස්කෘතික මධ්‍යස්ථානය**

සම අනුශූරතාවය - **මන්මුනේ උතුර හා මාතර නූපෙ සංස්කෘතික මධ්‍යස්ථානය**

## 4.5 අන්තර් රාජ්‍ය සේවක නිර්මාණ තරඟාවලිය

2002 වර්ෂයේ සිට වසරක් පාසා රාජ්‍ය සේවකයින්ගේ නිර්මාණාත්මක කුසලතාවයන් වැඩි දියුණු කිරීමට ඔවුන් උනන්දු කිරීමේ අරමුණින් කෙටි කතා, ළමා කතා, ගීත රචනා, පද්‍ය රචනා, කෙටි නාට්‍ය, කෙටිකතා පරිවර්තන හා චිත්‍ර යන අංශයන්ගෙන් හා සිංහල හා දෙමළ මාධ්‍ය වලින් රාජ්‍ය සේවකයින් අතර තරග පවත්වා ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා ජාතික මට්ටමින් ජයග්‍රාහකයින්ට සහතිකපත් හා

මුදල් ත්‍යාග පිරිනමනු ලැබේ. අවසානයේ ජයග්‍රාහී නිර්මාණ ඇතුළත් කර "ප්‍රභාෂ්වර" නමින් ග්‍රන්ථයක් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**2013 වර්ෂයේ අන්තර් රාජ්‍ය සේවක නිර්මාණ තරගාවලිය සඳහා නිර්මාණ ඉදිරිපත් කිරීම**

| | තරග අංශය | සිංහල මාධ්‍ය | දෙමළ මාධ්‍ය |
|---|---|---|---|
| **1.** | නාට්‍ය | **38** | **18** |
| **2.** | කෙටි කතා | **206** | **79** |
| **3.** | ගීත රචනා | **406** | **82** |
| **4.** | චිත්‍ර | **70** | **24** |
| **5.** | පද්‍ය රචනා | **598** | **189** |
| **6.** | ළමා නිර්මාණ | **87** | **26** |
| | එකතුව | **1405** | **418** |

## 4.6 රසවින්දන වැඩසටහන් පැවැත්වීම

පාසල් ළමයින්ගේ සහ තරුණ තරුණියන්ගේ සෞන්දර්යාත්මක රසවින්දන හැකියාවන් වර්ධනය කිරීම මගින් සංවේදී මිනිසුන්ගෙන් පිරි සමාජයක් බිහිකිරීම අරමුණු කොට තෝරාගත් පාසල් සහ විශේෂ ඉල්ලීම් සිදු කරන ආයතන සඳහා මෙම රස වින්දන වැඩසටහන් පවත්වනු ලැබේ. මෙහිදී අදාළ සෞන්දර්ය හෝ සාහිත්‍ය විෂයෙහි පළපුරුදු සම්පත්දායකවරයකුගේ මූලිකත්වයෙන් මෙම වැඩසටහන් පැවැත්වේ.

| | දිනය | ස්ථානය |
|---|---|---|
| **01** | 2013.02.12 | හික්කඩුව සංස්කෘතික මධ්‍යස්ථානය |
| **02** | 2013.02.12 | රද්ගම දේවපතිරාජ විද්‍යාලය - හික්කඩුව |
| **03** | 2013.02.20 | හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නවමු උපාධිධාරී සේවක කණ්ඩායම සඳහා |
| **04** | 2013.03.06 | ශ්‍රී ලංකා යුධ හමුදා මූලස්ථානය<br>යුධ හමුදා නිලධාරීන්ගේ සිවිල් කටයුතු පිළිබඳ ආත්ම විශ්වාසය නැංවීමේ දේශන මාලාව යටතේ දේශනය හා රසවින්දනය |
| **05** | 2013.03.22 | කැළණිය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය සිසුන් සඳහා රාගම වෛද්‍ය පීඨය |
| **06** | 2013.03.29 | කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| **07** | 2013.05.20 | මාතලේ සංස්කෘතික මධ්‍යස්ථානය |
| **08** | 2013.05.28 | වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| **09** | ” | මුරුතවෙල මහා විද්‍යාලය |
| **10** | 2013.06.19 | ගල්නෑව සංස්කෘතික මධ්‍යස්ථානය |
| **11** | ” | ගල්නෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| **12** | 2013.06.18 | රජරට විශ්ව විද්‍යාලය |
| **13** | ” | පුලියන්කුලම කෘෂි විද්‍යා පීඨය |

| | | |
|---|---|---|
| 14 | 2013.07.30 | අම්පාර මොරගහපල්ලම සීවලී විද්‍යාලය |
| 15 | | අම්පාර දමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| 16 | 2013.08.24 | වේයන්ගොඩ ජාතික පුහුණු මධ්‍යස්ථානය |
| 17 | 2013.08.31 | පස්සර ඌව කළමනාකරණ ආයතනය |
| 18 | 2013.09.04 | බුලත්සිංහල ජාතික පාසල් සහ ප්‍රා.ලේ. කාර්යාලය |
| 19 | 2013.09.10 | දොඩම්ගොඩ ප්‍රා.ලේ. කාර්යාලය |
| 20 | 2013.09.12 | අගලවත්ත කළුපහන විහාරස්ථානය |
| 21 | 2013.09.13 | ඉංගිරිය සාගර පලන්සූරිය මහා විද්‍යාලය |
| 22 | 2013.09.16 | බණ්ඩාරගම ප්‍රා.ලේ. කාර්යාලය |
| 23 | 2013.09.17 | මිල්ලනිය ප්‍රා.ලේ. කාර්යාලය |
| 24 | 2013.09.18 | බදුරලිය ප්‍රා.ලේ. කාර්යාලය |
| 25 | 2013.09.20 | මදුරුවල මහා විද්‍යාලය හා මදුරුවල ප්‍රා.ලේ. කාර්යාලය |
| 26 | 2013.09.23 | මතුගම ප්‍රා.ලේ. කාර්යාලය |
| 27 | 2013.09.24 | බේරුවල ප්‍රා.ලේ. කාර්යාලය |
| 28 | 2013.09.26 | හොරණ ප්‍රා.ලේ. කාර්යාලය |
| 29 | 2013.09.27 | ඉංගිරිය මහා විද්‍යාලය |
| 30 | 2013.10.10 | මතුගම සී. ඩබ්.ඩබ්. කන්නන්ගර විද්‍යාලය |
| 31 | 2013.11.01 | කුරුවිට සංස්කෘතික මධ්‍යස්ථානය |
| 32 | 2013.12.21 | මාතලේ දිස්ත්‍රික් මහ රෝහල හා මාතලේ පොළිස් ස්ථානය |

මෙම රසවින්දන වැඩසටහන් සඳහා මහජනතාව, විශේෂයෙන් තරුණ පිරිස විශාල වශයෙන් සහභාගි විය.

## 4.7 අස්පර්ෂ උරුම ලේඛනය සකස් කිරීම

*විවිධ ජන කණ්ඩායම් සහ සමහර අවස්ථාවල දී තනි තනි පුද්ගලයන් ස්වකීය සංස්කෘතික උරුමයේ කොටසක් ලෙස පිළිගනු ලබන පුරුදු, ඉදිරිපත් කිරීම්, ප්‍රකාශ, දැනුම, නිපුණතා මෙන්ම උපකරණ, වස්තු, කෞතුක භාණ්ඩ සහ ඒ හා සබැඳි සංස්කෘතික අවකාශ "අස්පෘෂ්‍ය සංස්කෘතික උරුමය" යනුවෙන් අර්ථ දැක්වේ.*

*මේ යටතට*

- *අස්පෘෂ්‍ය සංස්කෘතික උරුමයේ මාධ්‍යයක් වශයෙන් භාෂාව ඇතුළුව වාචික සම්ප්‍රදායන් සහ ප්‍රකාශ*
- *ලලිත කලාවන්*
- *සමාජමය පුරුදු, ශාන්තිකර්ම සහ මංගල/ උත්සව අවස්ථා*
- *ස්වභාව ධර්මයට සහ විශ්වයට අදාළ දැනුම සහ පුරුදු*
- *පාරම්පරික අත්කම් ශිල්ප අයත් වේ.*

***"ආරක්ෂා කිරීම"*** *යනුවෙන් අර්ථ දැක්වෙන්නේ ඉහත අස්පර්ෂ උරුමයන් හඳුනා ගැනීම, තොරතුරු රැස් කිරීම, වර්ග කිරීම හා ව්‍යාප්තිය, පර්යේෂණය, ආරක්ෂා කර ගැනීම, රැකවරණය සැලසීම, ප්‍රවර්ධනය, වැඩි දියුණු කිරීම, සම්ප්‍රේෂණය ඇතුළුව අස්පෘෂ්‍ය සංස්කෘතික උරුමයේ ශක්‍යතාව තහවුරු කිරීම ඉලක්ක කරගත් ක්‍රියාමාර්ගයන් ය.*

ශ්‍රී ලංකාවට ද අවුරුදු 2500 ක පැරණි අස්පර්ශ සංස්කෘතික වටිනාකමක් ඇත. එම වටිනාකම හඳුනාගැනීමත් සුදුසු උරුමයන් යළි භාවිතයට ගැනීමත්, මතු පරපුර වෙනුවෙන් ඒවා ආරක්ෂා කර ගැනීමත් යන කරුණු පිළිබඳ තෝරාගත් රාජ්‍ය නිළධාරීන්, මාධ්‍යවේදීන්, මානව විද්‍යාඥයින්, විශ්ව විද්‍යාල ආචාරයවරුන්ගෙන් සමන්විත 23 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් සඳහා 2012 වර්ෂයේදී පස් දින පුහුණු වැඩමුළුවක් කොළඹදී පවත්වන ලදී. එහි දෙවන වැඩමුළුව 2013 වර්ෂයේ මාර්තු 10 සිට 17 දක්වා පොල්ගොල්ල සමුපකාර සංවර්ධන පුහුණු ආයතනයේදී දින 08 ක් පුරා පැවැත්වීය. මෙම දෙවන වැඩමුළුවේ ප්‍රධානතම අරමුණ වූයේ අස්පර්ශ උරුම සංරක්ෂණය පිළිබඳ ලේඛනයක් (inventory) සකස් කිරීම පිණිස ප්‍රායෝගික ක්ෂේත්‍ර අධ්‍යයනයක් කොට අවශ්‍ය දැනුම ලබාදීමයි. මේ සඳහා යුනෙස්කෝ ආයතනය මූල්‍ය අනුග්‍රහය දැක්වූ අතර ඉන්දියාවෙන් සහ පකිස්ථානයෙන් සම්පත්දාරීන් ගෙන්වා ඔවුනගේ විශේෂඥ දැනුම වැඩමුළුවට එකතු කරන ලදී.

## 4.8 අස්පර්ශ උරුමය යළි නිරාවරණය කිරීමේ නියමු ව්‍යාපෘතිය- මාතලේ දිස්ත්‍රික්කය

වසර 2600ක ඉපැරණි ඉතිහාසයකින් යුක්ත වූ, මිල කල නොහැකි අස්පර්ෂ උරුමයන්ගෙන් සුපෝෂිත සංස්කෘතියකට උරුමකම් කියන වර්තමාන ශ්‍රී ලාංකික ජනතාවට එම සැඟවුනු උරුමයන් නැවත හඳුන්වාදී, එම උරුමයන්ගෙන් ප්‍රතිලාභ ලබා ගැනීමට අවස්ථාව ලබාදීම අරමුණු කොටගත් ව්‍යාපෘතියක් අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරයි.

නියමු ව්‍යාපෘතියක් වශයෙන් මාතලේ දිස්ත්‍රික්කයේ ජනතාව ඉලක්ක කර ගෙන මාස තුනක කාලයක් තුළ සමීක්ෂණයක් සිදු කර තොරතුරු රැස් කිරීමේ ව්‍යාපෘතියක් 2012 අගෝස්තු මාසයේ ආරම්භ කරන ලදී.

සමාජ විද්‍යාව, මානව විද්‍යාව, සිංහල සාහිත්‍ය, දමිළ සාහිත්‍ය හා ඉතිහාසය වැනි විෂයන් පිළිබඳ ප්‍රාමාණික දැනුමෙන් යුත් විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ගේ උපදේශකත්වය යටතේ ප්‍රාදේශීය සංස්කෘතික මධ්‍යස්ථානවල සේවයේ නියුතු සංස්කෘතික ප්‍රවර්ධන නිලධාරීන් හා නවක උපාධිධාරීන් තොරතුරු එකතු කිරීමට යොදවා ඇත.

- දත්ත හා තොරතුරු එකතු කිරීම
- තවදුරටත් පර්යේෂණ සඳහා භාජනය විය යුතු දැනුම ඒ සඳහා යොමු කිරීම
- හඳුනාගත් දැනුම ප්‍රසිද්ධ කිරීමත්
- ශ්‍රී ලංකාවට අනන්‍යතාවයක් දක්වන කරුණු අන්තර්ජාතික වශයෙන් ප්‍රසිද්ධියට පත් කිරීමත් ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් වේ.

**කාර්යභාරය 2013**

නියමු ව්‍යාපෘතියේ නිලධාරීන් 105ගෙන් යුත් පිරිසක් විසින් දත්ත රැස් කිරීම සිදු කරන ලද අතර දත්ත පත්‍රිකා 925 ක් සමීක්ෂණ කටයුතු සඳහා භාර දී ඇත. විද්වතුන් දස දෙනෙකුගෙන් යුත් පිරිසක් විසින් සමීක්ෂණ කටයුතු සිදු කර අදාළ සමීක්ෂණ වාර්තාව මාතලේ දිස්ත්‍රික් ලේකම් විසින් සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය වෙත භාර දෙන ලදී.

## 4.9 ජන සංගීත සංරක්ෂණ ව්‍යාපෘතිය

ශ්‍රී ලාංකික ජන ජීවිතය සමග ඒකාබද්ධව, අනාදිමත් කාලයක සිට පැවතෙමින් තිබෙන ජන ගායනා, ඒවායේ නාද මාලා සහ හේවිසි, වන්නම්, පූජා යාතු කර්මවල එන නාදමාලා ආදී ජන උරුමයන් පිළිබඳ තොරතුරු අභාවයට යා නොදී ආරක්ෂා කර එය අනාගතයේදීත් ජනතාවගේ ජීවිතයට බද්ධ කරලීම මගින් ජනතාවගේ රසවින්දන ශක්තීන් පුළුල් වනු ඇත. ඒ අනුව ඉහත ජන සංගීත කලාංග හා ඒවායේ නාදමාලා සංරක්ෂණය කිරීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වේ.

සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය විසින් නවීන තාක්ෂණයෙන් යුක්ත පරිගණක තාක්ෂණික උපකරණ පද්ධතියකින් සමන්විතව ජන සංගීත සංරක්ෂණ පුස්තකාලයක් 2010 සැප්තැම්බර් 23 වන දින ආරම්භ කරන ලදී. මේ සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දෙනු ලැබුවේ රාජකීය නෝර්වේජියානු රජයයි.

**මූලික කාර්යයන්**

- දැනට රටේ විවිධ ප්‍රදේශවල මහජනයා සතුව සහ විවිධ ආයතන සතුව විසිරී පවතින ඉහත සඳහන් කලාංග සොයා ගොස් තොරතුරු ඒකරාශී කිරීම
- එම තොරතුරු ඩිජිටල් තාක්ෂණය ඔස්සේ පටිගත කිරීම සහ සංරක්ෂණය කිරීම
- අධ්‍යයන සහ පර්යේෂණ අවශ්‍යතාවන් උදෙසා භාවිතයට ඉඩ ලබාදීම
- ඉහත සඳහන් දැනුම සමාජගත කිරීමට අවශ්‍ය ප්‍රවර්ධන කටයුතු සිදුකිරීම.

**ශ්‍රව්‍ය හා ශ්‍රව්‍ය - දෘෂ්‍ය පටිගත කිරීම්වල ප්‍රගතිය (2013)**

| | පටිගත කරන ලද ජන සංගීත අංගය | පටිගත කළ ජන ගී සංඛ්‍යාවේ දත්ත පරිමාව (GB) |
|---|---|---|
| | **ප්‍රගතිය - 2013** | |
| 1 | ආචාර්ය පණ්ඩිත් ඩබ්ලිව්.ඩී අමරදේව මහතා පිළිබඳ වාර්තා වැඩසටහන - ශ්‍රී ලංකා කලා මණ්ඩලය හා ජන සංගීත සංරක්ෂණ පුස්තකාලය එක්ව සංවිධානය කල එම වාර්තා වැඩසටහනේ මූලික සාකච්ඡාව පටිගත කිරීම්. | 35 GB |
| 2 | ආචාර්ය පණ්ඩිත් ඩබ්ලිව්.ඩී අමරදේව මහතා පිළිබඳ වාර්තා වැඩසටහනට සම්බන්ධ මූලික පටිගත කිරීම්. අමරදේව මහතාගේ නිවස, එතුමන්ගේ සංගීත භාණ්ඩ හා ඒ ආශ්‍රිත පටිගත කිරීම්. | 35 GB+ |
| 3 | යාපනය සංගීත උළෙල හා යාපනය අවට ග්‍රාමීය ප්‍රදේශවල ජන සංස්කෘතිකාංග හා ජන සංගීත අංග ශ්‍රව්‍ය දෘශ්‍ය පටිගත කිරීම්. | 249.3 GB |
| 4 | සිංහල දෙමළ නව අවුරුදු උදාව හා සමගාමී අලුත් අවුරුදු චාරිත්‍ර සහ ජන කෙළි සෙල්ලම් (Folk Games) ශ්‍රව්‍ය දෘශ්‍ය පටිගත කිරීම්. | 32 GB |
| 5 | ජාතික පුස්තකාල හා ප්‍රලේඛණ සේවා මණ්ඩලයේ 23 වන සංවත්සරය වෙනුවෙන් ජන සංගීත සංරක්ෂණ පුස්තකාලය ජන ගී රසවින්දන වැඩසටහන ඉදිරිපත් කිරීම සහ ශ්‍රව්‍ය දෘශ්‍ය පටිගත කිරීම්. | 7.48 GB |
| 6 | ආචාර්ය පණ්ඩිත් ඩබ්ලිව්.ඩී අමරදේව සංගීතවේදියානන් පිළිබඳව රචිත "අමරදේව" ජාතියේ ස්වර්ණ ස්වරය ග්‍රන්ථය දොරට වැඩීමේ උත්සවය ශ්‍රව්‍ය දෘශ්‍ය පටිගත කිරීම්. | 35 GB |

| | | |
|---|---|---|
| **7** | ශ්‍රී ලංකාවේ ප්‍රධාන ජන සංස්කෘතික අංගයක් වන ශාන්තිකර්ම පූජා විධි රටා අතර තිබෙන්නා වූ පන්දම් දොළහ ශාන්තිකර්මය දඹදෙණිය, අතුරුවල දී ශ්‍රව්‍ය දෘශ්‍ය පටිගත කිරීම. | **138.08 GB** |
| **8** | ශ්‍රී ලංකාවේ ප්‍රධාන ජන සංස්කෘතික අංගයක් වන ශාන්තිකර්ම පූජා විධි රටා අතර තිබෙන්නා වූ මල් කෙළිය ශාන්තිකර්මය **මාතලේ, නාඋල දී** ශ්‍රව්‍ය දෘශ්‍ය පටිගත කිරීම. | **50 GB** |
